සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය I,II

**නම/විභාග අංකය :- ........................................................** **කාලය: පැය 03යි විනාඩි 10 යි.**

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

<u>සැලකිය යුතුයි.</u>

**(i)** සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.

**(ii)** අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

**(iii)** ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) මට වුණේ **ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා** වගේ වැඩක් යැයි කියමින් ගුණදාස පිටත් ව ගියේය.

(1) අවදානම් වැඩක් අනුන් ලවා කරවීම. (2) ආපදාවෙන් ගැලවෙන්නෙක් නැත.
(3) කිසිම ප්‍රයෝජනයක් නොලැබීම. (4) එක් විපතකින් ගැලවී තවත් විපතකට පත් වීම.

(02) සමාජය තුළ වැඩ කිරීමේ දී ගැටවලට **හසුවන** අවස්ථා ද ඇත.

(1) අනුන්ගේ උගුල්වලට හසු වීම. (2) දරුණු ලෙස පළිගැනීම.
(3) ඕනෑවට එපාවට වැඩ කිරීම. (4) අනතුරක සේයා පහළ වීම.

(03) සමන් විභාග ප්‍රතිඵල ලැබෙන තුරු **ඇඟිලි ගනිමින්** සිටියේ ය.

(1) පමණට වඩා සූදානම් වීම. (2) නොඉවසිල්ලෙන් සිටීම.
(3) මහත් බියට පත් වීම. (4) තද ආශාවෙන් යමක එල්බ ගෙන සිටීම.

- **අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) පැරණි අධ්‍යාපන ක්‍රමය තුළ ................................ ප්‍රධාන කාර්යයකි.

(1) නිරීක්ෂණය (2) වනපොත් කිරීම. (3) පරිශීලනය (4) විමර්ශනය

(05) කඩිනම් ගල්ඔය ව්‍යාපාරය ආශ්‍රිතව ගොවි ජනපද ................................ කරන ලද්දේ මහාමාන්‍ය ඩී.එස්. සේනානායක මහතා විසිනි.

(1) ප්‍රතිසංස්කරණය (2) ප්‍රතිස්ථාපනය (3) ප්‍රතිෂ්ඨාපනය (4) ප්‍රතිනිර්මාණය

(06) රචනා රීතිය යනු භාෂා භාවිතයේ දී විශිෂ්ට ලෙස කෙරෙන පද ................................ යි.

(1) සංකෝචනය (2) සංඝටනය (3) කෙටිකිරීම (4) ගැළපීම.

(07) අකාරාදී පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.

(1) තබ්ලාව, බටනළාව, වීණාව, සර්පිනාව (2) නාමපද, ක්‍රියාපද, නිපාත, උපසර්ග

(3) රියන, නියන, කියත, මිටිය. (4) ළමයි, ගුරුවරු, දෙමව්පියෝ, ආදි ශිෂ්‍යයෝ

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) විශිෂ්ට, දෘෂ්ඨිය, නිශ්ඵල, කොට්ඨාසය. (2) දෘඪතර, සණ්ඨාරය, මජ්ඣිම, චන්දය.

(3) අලුයම, ගැටලු, සමස්ත, මහලු (4) ශාඛය, අවස්ථෝචිත, ව්‍යංගාර්ථ, දූරකථනය.

(09) අරුණ, ජීවිතය, මැදගිල්ල, ආධාර යන වචනවල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) කෙටි පාපිල්ල, කෙටි ඇදය, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල.

(2) කෙටි පාපිල්ල, කෙටි ඉස්පිල්ල, කෙටි ඇදය හා ඇලපිල්ල.

(3) කෙටි ඇදය, කෙටි පාපිල්ල, ඇලපිල්ල හා කෙටි ඉස්පිල්ල.

(4) කෙටි ඇදය, ඇලපිල්ල, කෙටි ඉස්පිල්ල හා කෙටි පාපිල්ල.

(10) ''රළ'' යන පදයෙහි අන්තර්ගත අක්ෂර වර්ගය වන්නේ,

(1) කණ්ඨජ (2) තාලුජ (3) මූර්ධජ (4) දන්තජ

(11) උක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ළමයෙක්, කාන්තාවක, අපි, කම්කරුවන් (2) ළමයි, අලියෙක්, වෛද්‍යවරු, ඔවුන්

(3) මිනිසුන්, නීතිඥවරයකු, ගොවියෙක්, මම (4) ළමයෙක්, කාන්තාවක්, ඔවුහු, ගුරුවරු.

(12) ''අති + අවශ්‍ය'' යන ප්‍රකෘතිය හා ප්‍රත්‍යය එක් වූ විට නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) අත්‍යවශ්‍ය (2) ආත්‍යාවශ්‍ය (3) ආත්‍යවශ්‍ය (4) අත්‍යාවශ්‍ය

(13) ''ආදිවාසීහු වන වදුලෙහි ජීවත්වීමට කැමැත්තක් දක්වති'' යන වාක්‍යයේ 'වන වදුලෙහි' යන්නෙහි විභක්තිය කුමක් ද?

(1) සම්බන්ධ විභක්තිය (2) කර්ම විභක්තිය (3) ආධාර විභක්තිය (4) කරණ විභත්තිය

- **අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.**

(14) සාර්ථක කෙටි කතාවක් **ආකස්මික ව** කළ හැකි දෙයක් නොවේ.

(1) හේතුවක් ඇතිව (2) ක්ෂණිකව (3) එක දිගට (4) හේතුවක් නැතිව

(15) කලා නිර්මාණ කරුවා තම අත්දැකීම් **ප්‍රතිනිර්මාණය** කිරීමෙන් නිර්මාණකරණයෙහි යෙදෙයි.

(1) යළි නිරීක්ෂණය (2) යළි ආපසු බැලීම (3) යළි ගොඩනැංවීම. (4) යළි උපකල්පනය

(16) '**ඤ**' යනු තාලුජ අක්ෂරයකි.

(1) මුදුනෙන් හටගන්නා (2) තල්ලෙන් හටගන්නා

(2) තොල්වලින් හටගන්නා (4) උගුරෙන් හට ගන්නා.

(17) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගය අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) තද්ධිත - සිරිමත්, ගුණවත්, කුල්මත්, දිරිමත් (2) මිශ්‍ර ක්‍රියා - ගය ගයා ලියමින්, කියමින්, බලමින්

(3) සන්ධි - එදිනෙදා, දකුණත, වියවුල, අරුණෝදය (4) සමාස - කිරිබත්, මව්පිය, වනමල්, දසබල

(18) දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී **නොපවත්නා** පද පේළිය තෝරන්න.

(1) පොත, පත්‍රය, සගරා, ලිපිය
(2) වඩු බංකුව, දඬුඅඬුව, අතකොළුව, කියත.
(3) පතල, ඉල්ලම් කුර, කුඩය, උදැල්ල.
(4) පෑන, පැන්සල, පන්හිඳ, කංචුකය.

(19) එක් එක් පද පේළියේ දී ඇති පදවලට **සමානාර්ථ යෙදුම්** පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) පොත - ග්‍රන්ථය, උවම් - උපමා, සබවස - අසත්‍යය, චිරන්තන - පෞරාණික.
(2) මුහුද - අර්ණවය, දැමය - ශාකය, අත - හස්තය, දියත - ලෝකය.
(3) නයන - ඇස, හසළත්වය - නිපුණත්වය, උක්තීන් - කියමන්, තඹර - මානෙල්.
(4) සෙව්වන්දි - ඉද්ද, ඉසුරු - සම්පත්, වණ - අකුර, සමය - ආගම.

(20) මුලි දී ඇති පදයට **සමානාර්ථයක් නොයෙදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) පණ්ඩිත - විද්වත්, බහුශ්‍රැත, ව්‍යක්ත, විශාරද.
(2) අනංගයා - වියොවග, මල්සරා, මින්දද, මලවි.
(3) දක්ෂ - විදග්ධ, නිපුණ, ස්නිග්ධ, ප්‍රවීණ.
(4) ජලය - අඹ, දල, උදක, සිලිල.

(21) **විරුද්ධාර්ථවත්** පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ආකුල - ව්‍යාකුල (2) නුවණ - නුනුවණ (3) ඍජු - කුටිල (4) ප්‍රත්‍යක්ෂ - අනුමාන

(22) **පූර්ව ක්‍රියාවක්** යෙදී ඇති වාක්‍යය කුමක් ද?

(1) දරුවා අඬමින් අම්මා ළඟට දිව්වේය.
(2) නීතිරීතිවලට අනුගතව කටයුතු කරනු මැනවි.
(3) ගෙවිලිය කවි කියමින් ගොයම් නෙළයි.
(4) ළමයා පොත් ටික අතට ගෙන පාසලට ඉක්මනින් ගියේ ය.

(23) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) 'තොමෝ' යන්නෙහි පුරුෂවාචී නාමපදය වන්නේ 'තෙමේ' යන්නයි.
(2) 'සිහිනිඟ යන්න ස්වරාදේශ සන්ධි පදයකි.
(3) 'අප' යන්න අනුක්ත නාමපදයකි.
(4) 'කිරිබත්' විභක්ති සමාස පදයකි.

- **අංක 24 සිට 26 තෙක් ප්‍රශ්නවල තද අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(24) ශ්‍රී ලංකාව **මනස්කාන්ත** දිවයිනකි.

(1) සිත් නළවන (2) සිත් සතුටු කරවන (3) සිත් ඇදගන්නා (4) සිත් ඔකඳ කරවන

(25) ජාතික ඖෂධ ප්‍රතිපත්තියක් ගොඩ නැංවීම සඳහා මහාචාර්ය සේනක බිබිලේ **අප්‍රතිහත** ධෛර්යයෙන් යුතුව කටයුතු කළේ ය.

(1) නොපසුබස්නා (2) ඉතා මහන්සියෙන් (3) සිත් රිදවන (4) අඛණ්ඩ

(26) පැරණි **සම්භාව්‍ය** කෘති රචනා කිරීමේ දී උපමා භාවිතයට ගෙන ඇත.

(1) පාලි (2) අලංකාර (3) පැරණි (4) උසස්

- **අංක 27, 28 ප්‍රශ්න යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ අන්තර්ගත වරණය තෝරන්න.**

(27) 'අය මාර්ග මුළුමනින් ම නැතිකර ගැනීම'

(1) අඬුව තිබෙද්දී අත පුළුස්සා ගැනීම.
(2) අතු කඩා මොර කන්නා සේ.
(3) ගෙන්දගම් පොළොව රත්වෙලා වගේ.
(4) ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ.

(28) 'නැති වූ දෙයෙහි අගය වැඩි යයි සිතීම'

(1) පරිස්සමට තිබූ දෙය ඇලියාවට ගියා වගෙයි.
(2) ගඟට ඉනි කැපුවා වගෙයි.
(3) ගිය ලූලා මහ එකා.
(4) ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.

◆ **අංක 29, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

(29) (1) සිසුහු පස්දෙනෙක් සිංහල විෂයට විශිෂ්ට සම්මාන හිමි කර ගත්හ.
(2) පයින් යන්නන් පාරේ දකුණු පසින් යා යුත්තාහ.
(3) අපි එය කළොත් යෙහෙකි.
(4) දක්ෂ ක්‍රීඩකයෙක් වන්නේ කෙසේ ද?

(30) (1) ගංගාවෝ ගලා බසියි.
(2) ඈ ගුරුවරියක වූවා ය.
(3) අපි ශ්‍රී ලාංකික පුරවැසියන්
(4) ඒ තෙම මහන්සියෙන් වැඩ කළේ ය.

(31)
- මොහොතක නිහඬතාවට ........... සභාවෙන් ප්‍රතිචාරයක් ලැබිණි.
- සෙබළු වහා ම ක්‍රියාත්මක වූ.......... ප්‍රතිවාදීන්ගේ ප්‍රයත්නය අසාර්ථක විය.
- සැළලිහිණි කවියා සන්ධ්‍යා වර්ණනය ........... අපූර්ව කාව්‍ය සංකල්පනා මැවීමට සමත් වේ.
- හින්දු උත්සව අතරින් දීවාලි ......... දීපවාලිය වැදගත් හා වර්ණවත් උත්සවයකි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?

(1) පසු, හෙවත්, බැවින්, තුළින්
(2) පසු, බැවින්, තුළින්, හෙවත්
(3) පසු, තුළින්, බැවින්, හෙවත්
(4) පසු, තුළින්, හෙවත්, බැවින්.

(32) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූවිට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''ඒ ගොල්ලො අපේ වැඩේ කරනව.''

(1) ඔවුහු අපේ වැඩ කරති. (2) ඔවුන් අපේ වැඩ කරති. (3) ඔව්හු අපේ වැඩ කරහු. (4) ඔවුන් අපේ වැඩ කරහි.

(33) 'සෙංකොට්ටං' නමැති නව කතාවේ රචකයා වන්නේ,

(1) ඒ.වී. සුරවීර
(2) සිරි ගුණසිංහ
(3) මහින්ද ප්‍රසාද් මස්ඉඹුල
(4) මහගමසේකර

(34) ශබ්ද ධ්වනිය වඩාත් ඉස්මතු වී පෙනෙන කවි පදය ඇතුළත් වරණය තෝරන්න.

(1) කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට
(2) සිසිවන දුවන ඉඟ සුඟ ගත හැකි මිටින
(3) සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී.
(4) පුවළ සිහළ දළ බළ මුළුනිති ඔසළ

(35) ''ඇගෙ රන්වන් මුව කුඩා ය; ජපා පුෂ්පයක් බඳු ය.'' යන පාඨයෙහි 'ජපා පුෂ්පයක්' යන්නෙහි අර්ථය කුමක් ද?

(1) නිල් මහනෙල්
(2) රෝස මලක්
(3) වද මලක්
(4) පිච්ච මලක්

(36) පහත සඳහන් කවියේ දෙවෙනි පදය සම්පූර්ණ කරන්න.

හැම ගනඳුරු බොන වර නිසයුරා ගත
...............................................................................
පුල් නිලුපුල් සම් වන් කතක වුවනත
කලදෝ කැට තෙලෙක දිසි වැනි පැහැ දිමුත

(1) නුබ කැට තෙලෙහි දිසි මෙන් තුරු පහන් වත
(2) ඉසි වැනි නිමල් මලිගිය මල් සිය දිමුත
(3) පහන් බැවින් පිටතට සස ලෙසින් වත
(4) තර පතරින් සඳ'දර තර පහර දෙත

(37) ''පෙර දිග ගොරහැඬි රකුසෝ
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගත්ත
කළු රෙදි පොට
මොකටද මේ තීරුවලට ඉරා දමන්නේ''

ඉහත සඳහන් කවියේ රචකයා වන්නේ,

(1) සිරි ගුණසිංහ (2) ගුණදාස අමරසේකර
(3) කුමාරතුංග මුනිදාස (4) චන්ද්‍රරත්න මානවසිංහ

(38) ප්‍රාදේශීය ව්‍යවහාරයේ දී 'බක්කම්මා' යනු
(1) බාලම්මා (2) කුඩම්මා (3) පුංචි අම්මා (4) ලොකු අම්මා.

(39) ''කළුගැහී තරගයට ඉහළ ගිය
සිමෙන්ති බිත්ති මිසක
ඇසට නිලට
අහසක් ගහක් කොළක
අවටත් නැත
නිව්යෝර්ක් නම් පුරවර
සියක් මහල් එක් ටැම් ගෙය මුදුනේ
දොර ජනෙල් වඩා සිර කළ කාමරයක
ඇඳක් - පුටුවක් - මේසයක්
මම''
මෙම පද්‍ය ඛණ්ඩයෙන් කියැවෙන්නේ,

(1) කාමරයක් ගැන ය. (2) බෝඩිමක් ගැන ය. (3) කාර්යාලයක් ගැන ය. (4) නිවසක් ගැන ය.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන උත්තරය තෝරන්න.

''මිනිස් හිතේ හට ගන්නා අදහස් හා හැඟීම් ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි''

(1) මිනිස් හිතේ පහළ වන හැඟීම් ප්‍රකාශ කරන මාධ්‍යය භාෂාවයි.
(2) මිනිස් සිත තුළ ජනිත වන අදහස් ප්‍රකාශ කරන උපකරණය භාෂාවයි.
(3) මිනිස් සිතෙහි පහළ වන සියලු ම දේ ප්‍රකාශ කරන උපකරණය භාෂාව යි.
(4) සිත තුළ ජනිත වන හැඟීම් ප්‍රකාශ කරනුයේ භාෂාව මගිනි. (ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම/විභාග අංකය :- ..........................................................

◆ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල හෝඩියේ ඇතුළත්
(අ) තාලුජ (ආ) මූර්ධජ අක්ෂරය බැගින් ලියන්න.

(ii) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) උත්තීර්ණ (ආ) විත්තිය

(iii) පහත සඳහන් පදවල ප්‍රකෘති වෙන් කර ලියන්න.
(අ) මහල්ලා (ආ) පිහිය

(iv) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් නිපාත පද දෙකක් උපුටා ලියන්න.
ඔහු දිගු නිවාඩුවකින් පසු ව නැවත සේවය සඳහා වාර්තා කළේ ය.

(v) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.
(අ) කම්මුල (ආ) ගුරුළිඳු

(vi) පහත සඳහන් "ල හා ළ" සහිත පද දෙකේ අර්ථය වෙන වෙන ම ලියන්න.
(අ) ලය (ආ) ළය

(vii) පහත සඳහන් වාක්‍යයේ පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
''ජාතික සම්ප්‍රදායට ගරු කරමින්, උත්සවය විශිෂ්ඨ අන්දමින් සරළ ව පැවැත්විණි.''

(viii) පහත සඳහන් වාක්‍ය දෙක සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) විදුලි ඉංජිනේරුවන් නව විදුලි බලාගාරයක කටයුතු අරඹති.
(ආ) අපි ළමයි හා පෙළට සිටියෙමු.

(ix) පහත දැක්වෙන වාක්‍ය දෙකෙහි ඉරි ඇඳි පදවලට ගැළපෙන සේ යුගල පද යොදා ලියන්න.
(අ) මේ මස සේවකයන්ට <u>වැටුප්</u> ගෙවීමට ආදායම ප්‍රමාණවත් නොවන බව ඔහු පැවසුවේ ය.
(ආ) වැදගත් වැඩක් <u>නොසැලකිලිමත්</u> ව කිරීම හොඳ නැත.

(x) පහත සඳහන් ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කර ලියන්න.
(අ) ගිය හකුරට නාඬන්නේ ..........................................................
(ආ) හිසරදේට .......................................................... මාරු කරන්නා සේ (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන අ , ආ , ඉ , ඊ යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ක්‍රීඩාව මිනිසාට කායික හා මානසික වශයෙන් ලබාදෙන රුකුල ඉමහත්ය. එය රටක උදාසීනත්වයෙන් තොර ක්‍රියාශීලී මිනිසුන් සංවර්ධනයට වටිනා මෙහෙයක් ඉටු කරයි. ශරීර සුවතාවය සඳහා ක්‍රීඩාවේ අගය පිළිබඳ සිතමු.

(ආ) කුණු කසළ අනිසි ලෙස බැහැර කිරීමෙන් සිදුවන හානිය බරපතල ය. මිනිසාගේ දැනුම්වත් වීමෙන් හා යහපත් ආකල්ප හේතුවෙන් මේවායින් මිදෙන්නට හැකි ය. අසුන්දර හැඩගැසීම් දුරු කර සුන්දර වටපිටාව කාගෙත් ශුභ සිද්ධිය උදා කරයි.

(ඉ) රටක සංවර්ධනයට පමණක් නොව එහි පැවැත්ම සඳහා විනය ගරුක සමාජයක් තිබිය යුතුයි. සදාචාර සම්පන්න විනයගරුක මිනිසුන් බිහිකිරීමට අදහන ආගම බලපායි. වර්තමානයේ මුදල හා තරගකාරීත්වය මේ සියල්ල යටපත් කරයි.

(ඊ) සුන්දරත්වය ලබාදෙන වනගහනයන් ශ්‍රී ලංකාවේ බොහෝය. මේවා තුළින් මිනිසාට ලැබෙන යහපත් ප්‍රතිඵල රාශියකි. එහෙත් මෙවැනි පාරිසරික දායාදවලට අද අත් වී ඇති තත්ත්වය කනගාටුදායක ය. වන සම්පත සුරැකීම හා ඒ සඳහා නිසි පිළියම් යෙදීම කාගේත් යුතුකමකි. (ලකුණු 25)

(03) පහත සඳහන් ඡේදය වචන 65 - 75 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කිසිම ආර්ථික ක්‍රමයක් හෝ සමාජ ක්‍රමයක් පූර්ව නූතන අවධියේ පවා සියවස් ගණනක් තිස්සේ ස්ථාවර ව හෝ නොවෙනස්ව හෝ නොපැවති බව වර්තමාන ඉතිහාසඥයෝ පිළිගනිති. ඉතිහාසය සම්බන්ධයෙන් සලකන කල මෙය ලෝකයේ කවර රටකට වුව ද සාධාරණය කෙසේ වුවද අභ්‍යන්තර වර්ධන, බාහිර පීඩන සහ බලපෑම් අනුව පමණක් නොව වසංගත වැනි විනාශකාරී අවස්ථාවල දී උද්ගත වන තත්ත්වයන් අනුව ද බලාපොරොත්තු රහිත ලෙස පිට පිට ම පැන නැගිය හැකි නියඟය, දුර්භික්ෂ වැනි ස්වභාවික ආපදා අනුව ද විවිධ කාලවල දී වෙනස්වීම් සිදුවිය හැකි අතර ඒවායේ ප්‍රමාණය විවිධාකාර වීමට ද පුළුවන. තවද බැලූ බැල්මට සුළු සුළු වෙනස්කම් පමණක් පෙන්නුම් කරන කාල පරිච්ඡේද ඇත්ත වශයෙන් ම මුල් බැස ගන්නා වූ වැදගත් වෙනස්කම් වර්ධනය වන කාල පරිච්ඡේද විය හැකි ය. ඒවායේ රාශිභූත ප්‍රතිඵල පැහැදිලිව දක්වන්නේ දශක ගණනාවකට පසුව ය.

කෙසේ වුව ද ප්‍රායෝගික අවශ්‍යතා සඳහා ඉතිහාසයේ පුළුල් කාල පරිච්ඡේද අළලා අර්ථවත් ලෙස පොදු නිගමනයන්ට එළඹීමට පුළුවන. එසේ කළ හැකිවන්නේ විශේෂයෙන් ආර්ථික සහ සමාජීය රටාවල රාමුව බොහෝ දුරට නොවෙනස්ව පැවති කාල පරිච්ඡේද සම්බන්ධයෙනි.

(ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

යටත් විජිත අවධියේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවීම් කෙරෙහි සැලකිලිමත් වීමේ දී අවධානය යොමු කළ යුතු තවත් වැදගත් කරුණු කීපයක් ඇත. ඒවා අතර අලුත් බෝග වර්ග, අලුත් කර්මාන්ත, නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍රෝපකරණ හඳුන්වා දීම සඳහන් කළ හැකි ය. දුම්කොළ වගාව නොඅනුමානව ම පෘතුගීසින් විසින් හඳුන්වා දෙනු ලැබූ අතර දිවයිනේ වයඹ දිග හා උතුරු ප්‍රදේශවල දුම්කොළ සරුවට වැඩුණි. දුම්කොළ වගා කළ ප්‍රදේශවලදී ම අලෙවි කෙරිණි. එය යාපනයේ සිට දකුණු ඉන්දියාවට අපනයනය කළ වැදගත් ද්‍රව්‍යයක් ද විය. මඤ්ඤොක්කා වගාව ගැන පෘතුගීසින්ගේ කාලයේ දී සුළු වශයෙන් දැන සිටින්නට ඇති නමුත් එය පුළුල් ලෙස ව්‍යාප්ත වූයේ ලන්දේසි කාලයේ දී ය. මල්බෙරි වගාව සහ පටපණුවන් ඇති කිරීම ආරම්භ කරන ලද්දේ ලන්දේසින් විසිනි. එහෙත් සේද කර්මාන්තය එතරම් සාර්ථක නොවීය. ඒකධිකාරී අපනයන බෝගයක් වශයෙන් කෝපි වගාව දහඅටවන සියවසේ මුල් භාගයේ දී ආරම්භ කෙරිණි.

ඉන් වසර කිහිපයකට පසුව එය සාර්ථක වූවත් ලන්දේසින් විසින් ම එය වගා කිරීම අධෛර්යවත් කරන ලදී. ඊට හේතු වූයේ එවකට ඔවුන්ට අවශ්‍ය තරම් කෝපි ජාවා දිවයිනෙන් ලබාගත හැකි වීමත් කිසියම් හේතුවක් නිසා ජාවා ප්‍රදේශයේ නිෂ්පාදනය අඩු වුවහොත් ලංකාවේ කෝපි වගාව යළි පුනරුත්ථාපනය කළ හැකි තත්ත්වයක පවතින බවට ඔවුන් තුළ විශ්වාසයක් ගොඩ නැගී තිබීමත් ය. ආරම්භයේ දී කෝපි සඳහා ඉහළ මිලක් ගෙවීමට ඉදිරිපත් වීමත් සමඟ වගාවේ සාර්ථකත්වය පෙන්නුම් කරන විට විශාල ලෙස මිල පහත දැමීමක් සිදුවිය.

(1) යටත් විජිත සමයේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදුවීම් කෙරෙහි බලපෑම් කළ කරුණු අතරින් එකක් සඳහන් කරන්න.

(2) මඤ්ඤොක්කා වගාව පුළුල් ලෙස පැතිරුණේ කුමන පාලන කාලයක දී ද?

(3) දිවයිනේ සරුවට වැඩුණු දුම්කොළ වගාව දැකිය හැකි වූයේ කුමන ප්‍රදේශවල ද?

(4) කෝපි සඳහා ගෙවන ලද ඉහළ මිල පහත දැමීමට හේතු වූ කරුණ වන්නේ කුමක් ද?

(5) කෝපි වගාව ඒකාධිකාරි අපනයන භෝගයක් ලෙස ආරම්භ වූයේ කුමන කාලයේ දී ද?

(ලකුණු 2 × 5 = 10)

(05) සඳසිරිගම විද්‍යාලයේ වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2020 අප්‍රේල් මස විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පැවැත්වීමට නියමිත අතර පහත සඳහන් පරිදි වැඩසටහන සාකච්ඡා කර ගෙන ඇත.

ප්‍රධාන ආරාධිත අමුත්තා - පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා

කලාපයේ සියලු ම අධ්‍යක්ෂවරුන්ට හා අවට පාසල්වල විදුහල්පතිවරුන්ට ආරාධනා කිරීම

එහි අංග වශයෙන් පිළිගැනීමේ ගීතයක්, නර්තන අංග 3ක් ත්‍යාග ලබාදීම ප්‍රාථමික අංශය හා ද්විතීක අංශය වශයෙන් අදියර 2ක් වශයෙන් ක්‍රියාත්මක වීමට නියමිත ය.

මෙම කරුණු සැලකිල්ලට ගෙන ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා න්‍යාය පත්‍රය සකස් කරන්න.

**නැතහොත්**

වරුණගම ප්‍රදේශවාසීන් විසින් වැඩිහිටි ප්‍රණාම උළෙලක් පසුගිය දින පැවැත්වීය. ප්‍රාදේශීය ලේකම්තුමා ද මෙයට සහභාගි විය. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ග්‍රාම නිලධාරි වසම් 18ක සිටින වයස්ගතම වැඩිහිටියෝ මෙහිදී ප්‍රණාම ලැබූහ. ප්‍රාදේශීය ශාසනාරක්ෂක බෞද්ධ බල මණ්ඩලයේ ලේඛකාධිකාරි කිතලගම ධම්මදස්සි නාහිමිපාණන් වහන්සේ ද උත්සවය සඳහා වැඩම කළ අතර මෙය කාලෝචිත වැඩසටහනක් බව අනුශාසනාවේ දී පැවසූහ. වරුණගම ප්‍රාදේශීය වාර්තාකරු රත්නසේකර ඔබ යැයි සිතා පුවත්පතක පළ කිරීම සඳහා වාර්තාවක් සකස් කරන්න.

(ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/විභාග අංකය :- ........................................................... කාලය: පැය 02යි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80කි.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "මගේ අත මිට තිබුණා. ඔක්කො ම ඒ නඩුව වෙනුවෙන් වියදම් කළා."

(අ) කවරකු විසින් මෙම ප්‍රකාශය කරන ලද්දේ ද?

(ආ) මෙම ප්‍රකාශය අසා සිටියේ කවු ද?

(ii) කාටත් හිමි පොදු දේ නම්
නැති බැරි හිඟ අවහිර කම්
...........................................................................
...........................................................................

(අ) ඉහත පද්‍යයේ ඉතිරි දෙපදය ලියන්න.

(ආ) මෙම කවිය රචනා කළ කවියාගේ මුල් ම කාව්‍ය කෘතිය නම් කරන්න.

(iii) "මොහු සිල්වත්නට අටපිරිකර දුන් බව දැන, "එ මහණැ"යි දකුණත දික් කළහ.

(අ) ඉහත උද්ධෘතය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

(ආ) 'සිල්වත්නට අටපිරිකර දුන්හ'යි මෙහි සඳහන් වන්නේ කවුරුන් ද?

(iv) අප බෝසතුන් මිස
අනෙකෙකු නො ම අසන ලෙස
සුර රජ සිට අහස
තතක් සිඳුව'යි කීය එ විගස

(අ) ඉහත කවිය උපුටා ගත් මුල් කෘතියේ කතුවරයා නම් කරන්න.

(ආ) 'සුර රජ'යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් ද?

(v) (අ) සාහිත්‍ය විද්‍යාව, කල්පනා ලෝකය යන කෘතිවල කතුවරයා නම් කරන්න.

(ආ) ඔහු රචනා කළ ස්වයං ලිඛිත චරිතාපදානය කුමක් ද?

(vi) "එහෙයින් දිවැසින් බලනුවෝ ප්‍රාර්ථනාව තෙල ලෙසින් ම සමෘද්ධ වන නියාව දැන සිනා පහළ කළහ"

(අ) මෙහි සඳහන් ප්‍රාර්ථනය කුමක් ද?

(ආ) ඉහත උද්ධෘතය ඇතුළත් මුල් කෘතියට මූලාශ්‍ර වූ ග්‍රන්ථය නම් කරන්න.

(vii) (අ) එච්. එම්. කුඩලිගම කවියා සිය නිර්මාණ සඳහා ආභාසය ලැබුයේ කුමන කවියෙකුගෙන් ද?

(ආ) කුඩලිගමයන්ගේ සමකලීන කවීන් දෙදෙනෙකු නම් කරන්න.

(viii) "ගියොත් හුදෙක් අපට ම ලජ්ජා වන්නී ය. ඔබ ගමන නොකැමැත්තෙමි."

(අ) ඉහත ප්‍රකාශය කළේ කවරෙක් ද?

(ආ) 'ඔබ ගමන' යනුවෙන් මෙහි සඳහන් වන ගමන කුමක් ද?

(ix) පහත සඳහන් ජනකවි ප්‍රභේද සඳහා නිදසුන් කවි වර්ග දෙකක් බැගින් දක්වන්න.

(අ) කෙළි ගී - (ආ) කෘෂි කර්මාන්තය හා බැඳුණු ජන කවි -

(x) (අ) අමාවතුර සඳහා මුල්කර ගත් බුදුගුණය කුමක් ද?

(ආ) අමාවතුර සඳහා කතුවරයා භාවිත කොට ඇත්තේ සිංහල කතා කලාවේ කුමන රීතිය ද? (ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) ගුත්තිල මහ **සිපී**
සක්දෙව් බසින් සැතපී
මින් දිනමැයි **දැපී**
බමර තත පළමුවෙන් සිඳපී

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) සමස්ත පද්‍යයෙහි අදහස ලියන්න.

(ii) 'රන් හැර ගෙන නොදෙමි. අපටත් රක්ෂාව නම් ඌ ම වේ ද?"

(අ) මෙම ප්‍රකාශය කළේ කවර හේතුවක් නිසා ද?

(ආ) අපටත් රක්ෂාව නම් ඌ ම වේ ද? යන්නෙහි අදහස ලියන්න.

(iii)"බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසන ලද ආශිර්විෂයක්හු මෙන් ක්‍රෝධයෙන් දිලිහී කිපුණාහු..."

(අ) බ්‍රහ්මදත්ත රජ්ජුරුවන් මෙසේ කෝපයට පත්වීමට හේතු වූයේ කුමක් ද?

(ආ) 'ආශිර්විෂයක්හු' යන්නෙහි අදහස ලියන්න.

(iv)"**වටාලා** ශිල්ප උගන්නට එන්නෝ නොවෙති. එ සෙ වන්නා හා මට ලාභ පිරිහෙයි. එ සෙ බැවින් ශිල්ප සමහරයට **උපචාර** යයි කියා මිනිස් දහසක් මරන්නට කියමි."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(v) "වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ
මුවපත් වූයේ
නියත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම් දෝ
මුළා වී මඟ නොපෙනේ"

(අ) තම පුතුගේ ක්‍රියාවෙන් මව කම්පනයට පත් වූ ආකාරය පැහැදිලි කරන්න.

(ආ) පුතු මෙසේ කිරීමට හේතු වූ කරුණු සඳහන් කරන්න. (ලකුණු 4 × 5 = 20)

(03) (i) මිනිස්කම පිළිබඳ සානුකම්පිත ව ද

(ii) හාස්‍යය හා උපහාසයෙන් යුතුව ද

චරිත නිරූපණය කිරීමට ධර්මසේන හිමියන් පෑ සමත්කම උග්ගසේන සිටුපුත්හුගේ කථා වස්තුව රසවත් සාහිත්‍යාංගයක් වීමට ඉවහල්වී ඇත. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්,**

(i) සමාජ හිතකාමීන් බිහිවීමටත්

(ii) සමාජ විරෝධී පුද්ගලයන් බිහිවීමටත්

ඇසුරු කරන්නන්ගේ හැසිරීම ඉවහල් වන්නේ කෙසේ දැයි අඟුල්මල් දමනයෙන් මනාව පැහැදිලි කෙරේ. එක් කරුණකට නිදසුන් දෙකක් බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15)

(04) (i) කවියා යොදා ගත් කාව්‍යෝපක්‍රමත්

(ii) කාව්‍යාලංකාරත්

ගංගාවේ සංගීතය පැදි පෙළ රසවත් නිර්මාණයක් වීමට හේතු වී ඇත.

සුදුසු නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්,**

(i) බස් වහර භාවිතයේ දී පෙන් වූ සමත්කමත්

(ii) රස විඳින්නන්ගේ හැසිරීමත් ගුත්තිල වෙණ නද පැදිපෙළ සාර්ථකත්වයට ඉවහල් වී ඇත. එක් කරුණකට නිදසුන් **දෙකක්** බැගින් දක්වමින් විමසන්න. (ලකුණු 15)

- **05, 06, 07 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**

(05) සහෘද මනසෙහි චිත්තරූප මැවෙන අයුරින් අවස්ථා හා සිද්ධි නිරූපණයට ජාතක කථා කතුවරයා සමතෙකි. සතර කන් මන්ත්‍රණයෙන් සුදුසු නිදසුන් **තුනක්වත්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(06) ජනකවියට සුවිශේෂී වූ ලක්ෂණ කවරේදැයි 'හානා හීය පානා අඬහැරෙන් දැනෙ' පැදි පෙළ ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(07) දිරියෙන් දිවියට මුහුණ දුන් අහිංසක ගැමි කතකගේ චරිතයක් ලෙස බැද්දේගම නවකතාවේ පුංචි මැණිකාගේ චරිතය නිරූපණය කොට ඇත. නියමිත කොටස ඇසුරින් නිදසුන් **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු

**I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 4 | (11) | 4 | (21) | 1 | (31) | 2 |
| (02) | 1 | (12) | 1 | (22) | 4 | (32) | 1 |
| (03) | 2 | (13) | 3 | (23) | 2 | (33) | 3 |
| (04) | 2 | (14) | 4 | (24) | 3 | (34) | 4 |
| (05) | 3 | (15) | 3 | (25) | 1 | (35) | 2 |
| (06) | 4 | (16) | 2 | (26) | 4 | (36) | 3 |
| (07) | 1 | (17) | 1 | (27) | 2 | (37) | 1 |
| (08) | 3 | (18) | 4 | (28) | 3 | (38) | 4 |
| (09) | 2 | (19) | 2 | (29) | 1 | (39) | 2 |
| (10) | 3 | (20) | 3 | (30) | 4 | (40) | 3 |

(ලකුණු 1 × 40 = 40)

**II කොටස**

(01) (i) (අ) තාලුජ (ඉ, ඊ, එ, ඡ, ජ, ඣ, ඤ, ඦ, ය, ශ)

(ආ) මූර්ධජ (ඍ, ඎ, ට, ඨ, ඩ, ණ, ඬ, ර, ෂ, ළ)

(ii) (අ) උත්තීර්ණ අවතීර්ණ

(ආ) විත්තිය - පැමිණිල්ල

(iii) (අ) මහලු (ආ) පිහි

(iv) නැවත, සඳහා, පසු, ය, ව

(v) (අ) කන්+මුල (ආ) ගුරුළු+ඉඳු

(vi) (අ) තාලය (ආ) හදවත

(vii) විශිෂ්ට, සරල

(viii)(අ) විදුලි ඉංජිනේරුවෝ නව විදුලි බලාගාරයක කටයුතු අරඹති.

(ආ) අපි ළමයින් හා පෙළ ට සිටියෙමු.

(ix) (අ) පඩි නඩි (ආ) ආවට ගියාට / එහෙන් මෙහෙන්

(x) (අ) තියෙන හකුරු රැක ගන්නේ

(ආ) කොට්ටෙ මාරු කරන්නා සේ (ලකුණු 2 x 10 = 20)

(02) කරුණුවල සාරවත්භාවයට (ලකුණු 08)
සංවිධානය නිර්මාණාත්මකභාවය හා ස්වාධීනත්වය (ලකුණු 12)
ශිල්පීය දක්ෂතා (ලකුණු 05)

(03) අන්තර්ගතය (ලකුණු 06)
වචන ගණන (ලකුණු 02)
ශිල්පීය දක්ෂතා (ලකුණු 02)

(04) (i) අලුත් බෝග වර්ග හඳුන්වා දීම.
අලුත් කර්මාන්ත හඳුන්වා දීම.
නව තාක්ෂණික ක්‍රම හා යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම. (මින් එක් කරුණක් ලියා තිබිය යුතු ය.)
(ii) ලන්දේසි පාලන කාලයේ දී ය.
(iii) වයඹ දිග හා උතුරු ප්‍රදේශවල
(iv) වගාවේ සාර්ථකත්වය / නිෂ්පාදනය වැඩිවීම
(v) අටවන සියවසේ මුල් භාගයේ දී ය. (ලකුණු 2 x 5 = 10)

(05) ආකෘතිය (ලකුණු 05)
අන්තර්ගතය (ලකුණු 07)
ශිල්පීය දක්ෂතා (ලකුණු 03)

## III කොටස

(01) (i) (අ) පුංචි මැණිකාට හිර ගෙදර අසල දී හමු වූ මහල්ලා
(ආ) පුංචි මැණිකා
(ii) (අ) මේ දේ මැඩගෙන දස්කම්
පෑම තමයි සුරුවිරුකම්
(ආ) ඔවා මුතු
(iii) (අ) අමාවතුර
(ආ) අඟුල්මල් / අංගුලිමාල
(iv) (අ) වැත්තෑවේ හිමි
(ආ) ශක්‍රයා
(v) (අ) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
(ආ) පිං ඇති සරසවි වරමක් දෙන්නේ
(vi) (අ) නිවන් දකිම්වා!
(ආ) පාලි ධම්මපදට්ඨ කථා
(vii) (අ) රබීන්ද්‍රනාත් තාගෝර්
(ආ) පී. බී. අල්විස් පෙරේරා, කපිල සෙනෙවිරත්න, මාකඳුරේ ගුණවර්ධන, මීමන ප්‍රේමතිලක, උපනන්ද බටුගෙදර
(viii)(අ) කේවට්ට බමුණා
(ආ) මියුලු නුවර වටලෑම

(ix) (අ) කෙළි ගී - මේවර කෙළිය, ඔළිඳ කෙළිය , ඔන්චිලි වාරම් , රබන් කවි , ලී කෙළි , කළගෙඩි නැටුම් ආදි...

(ආ) කෘෂි කර්මාන්තය හා බැඳුණු ජනකවි - කමත් කවි, නෙළුම් කවි, ගොයම් කවි, කුරහන් කවි, පැල් කවි ආදී...

(x) (අ) පුරිසදම්ම සාරථී

(ආ) සංක්ෂිප්ත රීතිය (ලකුණු 2 × 10 = 20)

(02) (1) (අ) මහා සිපී - මහා ශිල්පියා

දැපී - එඩිතරව

(ආ) මහා ශිල්පී ගුත්තිල සක්දෙවිගේ වචනයෙන් සංතෘප්ත ව, 'මෙයින් දිනමි' යි එඩිතර ව පළමු කොට බමර තත සිඳ දැමී ය.

(2) (අ) උග්ගසේන සිටුපුත්ගේ දෙමාපියන් යාළුවාණන් මසු දහසක් දී තම මිතුරාට විද්දත් දියණිය පාවා දෙන ලෙස ඉල්ලීම

(ආ) විද්දත් දුවගේ දෙමාපියන් යැපෙන්නේත් ඇයගෙන් ම නිසා.

(3) (අ) වේදේහ රජුගේ චර පුරුෂයෙක් මියුලු නුවර අටලොස් අක්ෂෞහිණියක් පමණ සේනාව මියුලු නුවර වටලා සිටින විට ජයපැන් බීමට වේදේහ රජුට කුමාර කල දොළෙක් උපන් බවත්, දැන් ඒ සඳහා ජයපැන් බොන බවත් පැවසීම

(ආ) විෂ සහිත සර්පයකු

(4) (අ) වටාලා - නැවත

උපචාර - පූජාව, සත්කාරය

(ආ) අඟුල්මල් දමනයෙහි දිසාපාමොක් ඇදුරුගේ ශිෂ්‍යයන් අහිංසක හා ගුරුවරයා භේද කිරීමට පැවසූ වදන්වලින් පසුව තමා විසින් ම අහිංසක මැරුවහොත් සිදුවන හානිය පිළිබඳව දිසාපාමොක් සිතන අවස්ථාව

(5) (අ) මේ කළ දෙයින් වනුයේ බරපතල වරදකි. නියත වශයෙන් ම විනාශ මුඛයට පැමිණ ඇත. මේ අවස්ථාවේ කුමක් කරම්දැයි නොදනිමි. යනුවෙන් කම්පා වී සිතයි.

(ආ) ඔහුගේ අණට විරුද්ධ වීමට නොව ගැලවීමට වෙන මඟක් නොමැති නිසා

(ලකුණු 4 × 5 = 20 යි.)

(03) , (04) ප්‍රශ්න සඳහා එක් ප්‍රශ්නයකට,

| | | | |
|---|---|---|---|
| නිදසුන් 4ක් සඳහා ලකුණු | 04 | | |
| සමස්ත විස්තරයට | 08 | | |
| මුළු ලකුණු | 15 | බැගින් 2 = | 30 |

(05) , (06) , (07) ප්‍රශ්නවලින් එකක් සඳහා,


| | |
|---|---|
| නිදසුන් 3ක් සඳහා ලකුණු | 03 |
| සමස්ත විස්තරයට | 07 |
| මුළු ලකුණු | 10 |


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


www.lol.lk
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371




































Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk
online Book Store

071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




මිටිටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

# ප්‍රශ්නපත්‍ර පොත් ගෙදරටම ගෙන්ව ගන්න ඔන්ලයින් ඔඩර් කරන්න

WWW.LOL.LK

වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal

NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE BOOK STORE

An evening of fun for young readers